# සරු අනාගතයක් ඇති

# කුළුබඩු අපනයනය

කුළු බඩු සඳහා ඇති ලෝක වෙළඳ පොළ සීඝ්‍රයෙන් වර්ධනය වෙමින් පවතින බවත්, මෙම තත්වය නොකඩවා පවතිනු ඇති බවත්, ජාත්‍යන්තර වෙළඳ මධ්‍යස්ථානය මගින් කරන ලද පරීක්ෂණයක දී පැහැදිලි වී ඇත. ප්‍රධාන වෙළඳ පොල 29 ක් ආශ්‍රයෙන් කරන ලද මෙම සමීක්ෂණයේ දී 1971/75 කාලය තුළ කුළු බඩු ටොන් 2,16,000 ක් වාර්ෂිකව ආනයනය කර ඇති බව හෙළි විය. මෙය මුළු ලෝක වෙළඳ පොළ ප්‍රමාණයෙන් 4/5 ක් පමණ වේ. ජාත්‍යන්තර වෙළඳ පොළට එවන කුළු බඩු වලින් වැඩි ප්‍රමාණයක්ම නිෂ්පාදනය කෙරෙනුයේ දියුණු වන රටවල ය. දියුණු වන රටවල් කිහිපයක් කුළු බඩු අපනයනය වර්ධනය කිරීමේලා සැහෙන ප්‍රගතියක් දක්වා ඇති අතර, මෙය කුළු බඩු බහුලව ඇති සෙසු රටවලට ද ආදර්ශයක් වනු නිසැක ය.

## ලෝක වෙළඳ පොල

වෙළඳ පොළ රටාව – කුළු බඩු ආනයනය සඳහා වැඩි ඉල්ලුමක් ඇත්තේ උතුරු ඇමරිකානු හා බටහිර යුරෝපා ප්‍රදේශවලය. බටහිර ජර්මනිය, නෙදර්ලන්තය, ප්‍රංශය, ස්පාඤ්ඤය, ස්වීඩනය, ජපානය සහ ප්‍රජාතන්ත්‍රවාදී ජර්මන් ජනරජය, පෝලන්තය වැනි නැගෙනහිර යුරෝපීය රටවල්වල ද කුළු බඩු ආනයනයෙහි ලා දැඩි වර්ධනයක් දක්වා ඇති රටවල් ය.

යුරෝපීය පොදු හවුලේ රටවල්, ස්කැන්ඩිනේවියානු රටවල්, ස්පාඤ්ඤය, ස්විට්සර්ලන්තය හා ඔස්ට්‍රේලියාව 1975 දී කුළු බඩු ටොන් 86,000 ක් ආනයනය කර ඇති අතර, මෙය පස් වසරක් තුළ 20% ක වැඩි වීමක් පෙන්නුම් කරන්නකි. බටහිර ජර්මනිය යුරෝපයේ ඇති විශාලම කුළු බඩු වෙළෙඳ පොළ වේ. බටහිර යුරෝපයට 1975 දී යවනු ලැබූ කුළු බඩු වලින් තුනෙන් එකක් ම ගෙන ඇත්තේ බටහිර ජර්මනියයි. ඊළඟට වැදගත් කොට සැලකෙන්නේ එංගලන්තය හා ප්‍රංශයයි. නෙදර්ලන්තයේ වෙළඳ පොළ සුළු එකක් වුවත්, එහි ඇම්ස්ටඩෑම් හා රොටර්ඩෑම් යන නගර වෙනත් යුරෝපීය වෙළඳ පොලවල් සඳහා කුළු බඩු හුවමාරු කරන ඉතා වැදගත් වෙළඳ මධ්‍යස්ථානයක් වේ. කරදමුංගු සඳහා මැද පෙරදිග හැරුනුවිට ඉතා හොඳ වෙළඳ පොලවල් ඇත්තේ බටහිර යුරෝපයේ ස්වීඩනය හා පින්ලන්තය යි.

## වැදගත්ම වෙළඳ පොළ

කුළු බඩු සඳහා ලොව ඇති හොඳම මෙන්ම වැදගත් වෙළඳ පොල ඇමරිකාව වේ. 1971/75 කාලය තුළ ඇමරිකාව වසරකට කුළු බඩු ටොන් 67,350 ක් ආනයනය කොට ඇත. දැනට කැනඩාව සුළුවෙළඳ පොලක් ලෙස සැලකුණත් අනාගතයේ දී එහි සීඝ්‍ර වර්ධනයක් ඇති වන ලකුණු දක්නට තිබේ. නැගෙනහිර යුරෝපයේ සමාජවාදී රටවල් ද්විපාක්ෂික වෙළඳ ගිවිසුම් යටතේ විශේෂයෙන් ම ඉන්දියාවේ ගම්මිරිස් සඳහා ඇති හොඳම වෙළඳ පොළ වී ඇත.

ලොව කරදමුංගු නිෂ්පාදනයෙන් 80%ක් ම මිළට ගන්නා මැද පෙරදිග ඒ සඳහා ඇති හොඳම වෙළඳ පොල වේ. ආසියාව හා පැසිපික් ප්‍රදේශවල ප්‍රධාන කුළු බඩු ආනයනික රට වන්නේ ජපානයයි. ඉන්

පසුව ඔස්ට්‍රේලියාව හා නිව්සීලන්තය යි. සිංගප්පූරුව හා හොංකොං හරහා කුළු බඩු විශාල ප්‍රමාණයක් අලෙවියට යැවුණද, මෙම රටවල් පරිභෝජනය කරන්නේ සුළු ප්‍රමාණයකි. ආසියානු කලාපයේ දියුණු වන රටවල් හා සැලකූ විට ලොව විශාලම කරාබු නැටි පරිභෝජකයා වන ඉන්දුනීසියාව වැදගත් තැනක් ගනී. විවිධ ආකාරවලින් කුළු බඩු අලෙවි වුනද නිෂ්පාදනයෙන් 90% ක් පමණ ම එලෙසම අලෙවි වේ. ඉතිරිය කුළු බඩු තෙල් ලෙස අලෙවි වේ.

එක් එක් රටවල් විශේෂිත කුළු බඩු වර්ග සඳහා විශේෂ ඇල්මක් දැක්වීම කුළු බඩු අලෙවියේ දක්නට ලැබෙන විශේෂ ලක්ෂණයකි. පොදුවේ ගත් කළ සෑම රටක් ම වාගේ වැඩි ප්‍රමාණයක් හා වැඩි වටිනාකමක් ගෙවා ගෙන්වා ගන්නේ ගම්මිරිස්ය. සවුදි අරාබිය, කුවයිට් හා පින්ලන්තය, කරදමුංගු වැඩියෙන් ආනයනය කරන අතර, ප්‍රජාතන්ත්‍රවාදී යේමනය ඉඟුරු හා මිරිස් ආනයනය කරයි. බටහිර යුරෝපා හා උතුරු ඇමරිකානු රටවල් කුරුඳු හා කැසියා සමඟ සාදික්කා හා වසාවාසිවලට වැඩි කැමැත්තක් දක්වනු ලබයි.

අලෙවි ප්‍රමාණය අනුව මිළහට වැදගත් වනුයේ ඉඟුරු, සියඹලා, හා කොත්තමල්ලි වැනි කුළු බඩු ඇට වර්ග ය. වසරකට කුළු බඩු ඇට වර්ග ටොන් 35,000 ක් පමණ ආනයනය කෙරුණ ද සාමාන්‍යයෙන් ඒවා අඩු වටිනාකම් ද්‍රව්‍ය ලෙස සැලකේ. එමෙන් ම ඉතා අඩු ප්‍රමාණයෙන් අලෙවිවන එහෙත් දැඩි වාණිජමය වටිනාකමක් ඇති කුළු බඩු වන්නේ කරදමුංගු, කහ සහ වැනිලා ය. කරාබු ඉතිරි වටිනා කුළු බඩු ද්‍රව්‍යය ලෙස සැලකුණ ද විශේෂ සිගරට් වර්ගයක් නිපදවීම සඳහා ලොව අපනයන ප්‍රමාණයෙන් 75% ක් ම ඉන්දුනීසියාව විසින් මිළට ගන්නා බව මෙහිලා සැලකිය යුතු ය.

**පරිභෝජනය–** දියුණුවන රටවල් මෙන් ම කාර්මික රටවල කුළු බඩු පරිභෝජනයට බලපාන මූලික සාධක දෙකක්ම ඇත්තේ ඒවායේ ජනගහණයන් හා ඒවා වැඩි වන ප්‍රමාණත් ය. අනෙක් අතට සියළු ම කුළු බඩු වර්ගයන් සඳහා මෙන් ම එක් එක් කුළු බඩු පිළිබඳව ඒක පුද්ගල පරිභෝජනය ප්‍රමාණයන් ද රටින් රටට වෙනස් වේ. කාර්මික හා සංවර්ධනය වන රටවල් කුළු බඩු පරිභෝජනයට බලපා ඇත්තේ ආහාර පිසීමේ මෙන් ම අනුභව කිරීමේ සමාජ චාරිත්‍රයි. ආදායම් තත්වයන් හා මිළ ද ඒක පුද්ගල පරිභෝජනයට බලපානු ලබයි. කාර්මික රටවල් කුළු බඩු විශාල වශයෙන් පරිභෝජනයට ගන්නේ කර්මාන්තවලටය. විශේෂයෙන් ම ආහාර සකස් කිරීමේ ලා කාර්මික රටවල ආහාර කර්මාන්තයේ විශේෂයෙන් ම මස්, මාළු, එළවළු නිෂ්පාදන හා එම රටවලට ආවේණික සුළු කෑම ද්‍රව්‍ය සකස් කිරීමේ ලා කුළු බඩු බහුලව ප්‍රයෝජනයට ගනී. මස් කර්මාන්තය එම රටවල කුළු බඩු බහුලව පරිභෝජනයට ගැනෙන ක්ෂේත්‍රය වේ. ඖෂධ, සුවඳ විලවුන් හා මද්‍යසාර නිෂ්පාදනයේ ලා ද කුළු බඩු ප්‍රයෝජනයට ගැනේ. මෙම අවස්ථා හැරුනු විට සමීක්ෂණයට ලක් වූ රටවල කුළු බඩු වැඩි මනත්ම ප්‍රයෝජනයට ගෙන ඇත්තේ ඉහත සඳහන් ආහාර ද්‍රව්‍ය සකස් කිරීමේ ලා ය.

**ගෙදර දෙර –** ගෙදර දෙර භාවිතයේලා සියළු ම කුළු බඩු ද්‍රව්‍ය අභිබවා ඇත්තේ ගම්මිරිස් ය. සාදික්කා, කුරුඳු හා වැනිලා ද පොදුවේ බහුලව භාවිතා වේ.

**වෙනත්–** ඉහත සඳහන් අවස්ථා හැරුණු විට ආපනශාලා, භෝජනාගාර, රෝහල් හා පාසල්වල ද කුළු බඩු සුළු ප්‍රමාණයන්ගෙන් ප්‍රයෝජනයට ගැනේ.

**වෙළඳ රටා වෙනස්වීම–** පසුගිය අවුරුදු කිහිපය තුළ දී කුළු බඩු වෙළඳ රටාවේ එනම් නිෂ්පාදන හා අපනයන රටවල්වල මෙන් ම ආනයනික රටවල්වල ද වෙනස් කම් සිදු වී ඇත.

**නිෂ්පාදක රටවල්–** කුළු බඩු නිපදවන රටවල දක්නට ලැබෙන විශේෂ නව ලක්ෂණය නම් කුළු බඩු සංවර්ධන මණ්ඩල පිහිටුවීම ය. මෙය වගා කටයුතු මෙන් ම

අලෙවි කටයුතු සම්බන්ධව අරමුණු කර ගෙන පිහිටුවනු ලැබූ ඇත. සමහර රටවල රජයේ පියවර ඇතිව පිහිටුවනු ලැබූ මෙම මණ්ඩල වෙළඳාම් වැඩි කිරීමේලා දැඩි ප්‍රයත්නයන් ගෙන ඇත. ඉල්ලුමට සරිලන ලෙස නිෂ්පාදනය වැඩි කිරීම හා ප්‍රශස්ථ පාලන කටයුතු හා අලෙවි කටයුතු සම්බන්ධීකරණය කිරීමට ද බොහෝ රටවල් විසින් උත්සාහයක් දරා ඇත. මෙහිලා වැදගත් පියවර ගෙන ඇති රටවල් පිළිබඳ විස්තර 1 වන වගුවෙන් දැක්වේ.

ඉන්දියාව, මැලේසියාව හා ඉන්දුනීසියාව 1972 දී පිහිටුවා ගන්නා ලද ගම්මිරිස් සමූහ කාණ්ඩය, ජාත්‍යන්තර මට්ටමේ සහභාගිතාවය මත ගම්මිරිස් වෙළඳාම වැදගත් වාසිදයක තත්වයකට ගෙන ඒමට දරා ඇති කදිම පියවරකි. මෙහි ලේකම් කාර්යාලය ජකර්තාහි පිහිටුවා ඇත. මෙහි වැඩකටයුතු මෑතක දී ඇරඹී ඇති අතර, ගම්මිරිස්වලට ස්ථාවර මිළක් ලබා ගැනීම, ගම්මිරිස් සඳහා ඇති ඉල්ලුම වැඩි කිරීම, ගම්මිරිස් වවන්නන්ට ස්ථිර සාධාරණ ආදායමක් ලබා දීම මෙම සාමූහික ප්‍රයත්නයේ මූලික අභිමතාර්ථ

**පළවන වගුව**

| රට | කුළුබඩු | සංවර්ධන ආයතනය |
|---|---|---|
| ජැරමයිකාව | පිමෙන්ටෝ | පිමෙන්ටෝ අලෙවි මණ්ඩලය |
| ග්‍රිනිඩා | සාදික්කා හා වසාවාසි | ග්‍රිනිඩා සමුපකාර සාදික්කා සංගමය |
| ඉන්දියාව | කරදමුංගු | කරදමුංගු මණ්ඩලය |
| මැඩගස්කාර් | වැනිලා | වැනිලා ප්‍රවෘත්ති සේවය (ඇමරිකාවේ හා ප්‍රංශයේ මෙම කාර්යාල පිහිටුවා ඇත.) |
| ටැන්සානියාව | කරාබු | සැන්සිබාර් රාජ්‍ය වෙළඳ සංස්ථාව |
| මැලේසියාව | ගම්මිරිස් | ගම්මිරිස් අලෙවි මණ්ඩලය |
| ඉන්දුනීසියාව | කළු ගම්මිරිස් | මධ්‍යම ඉන්දුනීසියානු වෙළඳ සංගමය (නිව්යෝක් හි හා ඇම්ස්ටඩෑම් හි කාර්යාල පිහිටුවා ඇත.) |

## ගම්මිරිස්

ගම්මිරිස් ජාත්‍යන්තර කුළු බඩු වෙළඳාමේ වැඩි ප්‍රමාණයක් හා වැඩි අගයක් ඇති ද්‍රව්‍යය වන ගම්මිරිස් අලෙවිය ව්‍යාප්ත කිරීම සඳහා එම් වගා රටවල් දැඩි උනන්දුවක් දැක්වීම පුදුමයට පත් විය යුතු කරුණක් නොවේ. තම වෙළඳ ආයතනවල ශාඛාවන් ගම්මිරිස් අලෙවියේ ලා වැදගත් වන නිව්යෝක් හා ඇම්ස්ට ඩෑම් යන නගරවල පිහිටුවා කටයුතු කරන ඉන්දුනීසියාවත්, සරවක්හි තම ගම්මිරිස් අලෙවි මණ්ඩලය පිහිටුවා ඇති මැලේසියාවත් මෙහිලා කැපී පෙනෙන නිදසුන් ය.

යවේ. මෙවැනිම ජාත්‍යන්තර ක්‍රියා දමයක් ළඟදී ම කරදමුංගු සඳහා ද ක්‍රියාත්මක වීමට ඉඩ තිබේ.

**ආනයනික රටවල්**– ඉතා මෑතක් වන තුරුම ආනයනික රටවල් කුළු බඩු වෙළඳාම කරන ලද්දේ පුද්ගලික වෙළෙන්දන් මගිනි. කුළු බඩු අවශ්‍ය වෙළෙන්ද තමා හා සම්බන්ධකම් ඇති වෙළෙන්දන් ගෙන් කෙලින් ම හෝ තැරැව්කාරයන් හා ඒජන්තවරුන් මගින් කුළු බඩු මිළට ගැනීම සම්ප්‍රදායිකව කෙරෙන්නකි. එහෙත් දැන් ආනයනිකයන් හා පාරිභෝජකයන් එක් අතකිනුත් නිෂ්පාදන රටවල්වල සිටින බඩු සපයන්නන් අතරත් කෙලින් ම සම්බන්ධතාවයන් ඇතිව

තිබෙනු දක්නා ලැබේ. මෙය ප්‍රධාන කුළු බඩු වෙළඳ මධ්‍යස්ථාන වල තැරැව් කාරයින් අඩු කර ලීමට හේතු වී ඇත.

මෙහිලා සිදුව ඇති තවත් වැදගත් වෙන සක් නම් ශාඛා ආයතන රැසක් ඇතිව ආහාර වෙළඳාම් කරන විශාල සමාගම් කෙලින් ම කුළු බඩු ආනයනය කොට කුඩු කර ඇසුරුම් කොට තමන් විසින් ම විකිණීමයි. මීට කලින් මෙම එක් එක් කටයුතු ඒ හා සම්බන්ධ වූ විශේෂිත ඒජන්තවරුන් ලවා කරවනු ලැබිණ. ඇමරිකාවේ ස්ප්වේ හා බටහිර ජර්මනියේ ඉඩේකා මෙහි කැපී පෙනෙන ආයතනයන් ය.

**අලෙවි සංවර්ධනය–** කුළු බඩු නිෂ්පාදන අලෙවි කිරීමේ ලා අලෙවි සංවිධාන හා ප්‍රචාරක කටයුතු දැඩි සංවිධානාත්මක මට්ට මකින් කෙරෙනු දක්නට නොලැබේ. වෙළඳ නාමයන් ඇති ද්‍රව්‍ය සඳහා පමණක් මෙය සිදු වනු දක්නා ලැබේ. ඇමරිකාව හා කැන ඩාවේ එවැනි සංවර්ධන කටයුතු මඳක් කෙරුණත් සෙසු වැදගත් ආනයනික රටවල මෙවැනි සංවිධානාත්මක ප්‍රචාරක කටයුතු දක්නට නැත.

**නිෂ්පාදකයින්–** නිෂ්පාදක රටවල් ද මෙවැනි සංවර්ධන කටයුතුවල යෙදෙනු බහුලව දක්නට නොලැබේ. ඉන්දියාව එක් උදහරණයක් ලෙස මෙහිලා දක්විය හැකි ය. ඉන්දියාවේ එර්නාකුලම්හි පිහිටුවා ඇති කුළුබඩු අපනයන සංවර්ධන මණ්ඩලය, ඇමරිකානු කුළුබඩු වෙළඳ සංගමයේ සහාය ඇතිව තම කරදමුංගු හා ගම්මිරිස් අලෙවිය වැඩි කර ගැනීම සඳහා, වෙළඳසැල් සකස් කර ප්‍රදර්ශන පැවැත්වීම, විශේෂ වෙළඳ දූත පිරිස් යැවීම වැනි අලෙවි සංවර්ධන කටයුතු වල යෙදී ඇත. මැලේසියානු ගම්මිරිස් අලෙවි මණ්ඩලයේ ප්‍රධාන කාර්යයක් වන්නේ ගම්මිරිස් සඳහා පිටරට වෙළඳ පොලවල් අල්ලා ගැනීම යි. දනට මෙම මණ්ඩලය වෙළඳ විමසීම්වලට පිළිතුරු සැපයීම, ගම්මිරිස් අපනයනය හා තම වෙළෙන්දන්ට පිටරට හවුල් කරුවන් සොයා දීම හා ගම්මිරිස්, සාදික්කා එම රටවලට යැවීම, වෙළඳ සල්පිල්වලට සහභාගිවීම වැනි කටයුතු වල පමණක් නිරත උනත් වඩා ඉහළ තත්වයේ ගම්මිරිස් අපනයනය කිරීම සඳහා මණ්ඩලය මගින් පිහිටුවීමට යන ගම්මිරිස් වර්ග කිරීමේ හා සකස් කිරීමේ මධ්‍යස්ථාන පිහිටුවූ පසු මෙම මණ්ඩලයේ විදේශීය කටයුතුවල දැඩි වර්ධනයක් වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

ඇමරිකාව හා ප්‍රංශය විසින් වැනිලා නිෂ්පාදන රටක් වන මැඩගස්කාර් නියෝජිත යින් සමහ වැනිලා අලෙවිය සම්බන්ධ කටයුතුවල යෙදීම තවත් විශේෂ ලක්ෂණ යකි. කරදමුංගු හා ගම්මිරිස් සඳහා ද මෙවැනි ක්‍රම ක්‍රියාත්මක කළ හැක.

**හවුල් සංවර්ධන වැඩ–** මෙසේ හවුල් සංවර්ධන කටයුතු වල යෙදී වාසි ලබා ගත හැකි තවත් නිෂ්පාදනයක් නම් ගම්මිරිස් ය. ජාත්‍යන්තර වෙළඳ පොලේ වසරකට සාමා න්‍ය ගම්මිරිස් අලෙවි වටිනාකම ඩොලර් 15 කෝටියකි. මෙවැනි පියවර ආනයනික රටවලට මෙන් ම මැලේසියාව, ඉන්දුනීසියා ඉන්දියාව හා බ්‍රසීලය වැනි ප්‍රධාන ගම්මිරිස් නිෂ්පාදන රටවලට ද ක්‍රියාත්මක කළ හැක. ගම්මිරිස් බහුලව භාවිතා වන ද්‍රව්‍යයක්වුවත් ගම්මිරිස් භාවිතය අඩු රටවල එය වඩාත් ජනප්‍රිය කරලීම හා ආහාර මෙන් ම සෙසු කටයුතු සඳහා ගම්මිරිස්වල ඇති වැදගත් කම ප්‍රචාරය කර ලීමෙන් ගම්මිරිස් වෙළඳාම දනටමත් වඩා ව්‍යාප්ත කිරීමට ඇති ඉඩකඩ බොහෝ බව පැහැදිලි වී ඇත. කරදමුංගු හා වැනිලා සඳහා ද මෙවැනි ම ඉඩක් ඇත.

**ප්‍රමිති–** කුළු බඩු අපනයන, ඒවා ආනය නික රටවල ඇති සනීපාරක්ෂක නීති රීති හා ස්ථාවර ප්‍රමිති පිරිවිතරවලට අනුකූල විය යුතුම ය. මේ නිසාවෙන් ම කුළු බඩු වෙළෙඳාම්වලින් කෙරෙන ගනුදෙනුවල හා සාකච්ඡාවල දී නිරතුරුවම ප්‍රමිති හා ප්‍රශස්ථ අවශ්‍යතා ගැන නිතරම සඳහන් වනු දක්නට ලැබේ. මේ අනුව අලෙවි කරන්නා හා මිළට ගන්නා යන දෙපැත්තම පිළිගත් ප්‍රමිති පිරිවිතරවලට අනුකූල දැයි පරීක්ෂාවලට ලක් වූ කුළු බඩු වර්ග පමණක් අලෙවි කිරීමේ ලා වගකීමකින්යුතුව බැඳි

(13 වන පිටුව බලන්න)

# සරු අනාගතයක් ඇති...

(11 වන පිටුව හා සම්බන්ධයි)

සිටි. වෙළඳ පොල සඳහා ඉදිරිපත් වන කුළු බඩු වර්ගවලත් ඒවා සැකසීමේ දී භාවිතා වන ක්‍රමත් බොහෝ විට මෙහිලා ජාත්‍යන්තර ප්‍රමිති පිරිවිතරවලට අවශ්‍යතා වය දැඩි ලෙස පෙන්නුම් කරන්නකි.

මෙ නිසා ජාත්‍යන්තර ප්‍රමිති ආයතනය මගින් දැනටමත් කළු ගම්මිරිස්, කරදමුංගු, ඉඟුරු, මිරිස් හා පිමෙන්ටෝ සඳහා ජාත්‍යන්තර ප්‍රමිති සකස් කොට ඇත. මේ අතර තුනපහ, කුරුඳු, කරාබු, සියඹලා හා වෙනත් කුළු බඩු ඇට වර්ග සඳහා මෙවැනි ප්‍රමිති සකස් වෙමින් පවතී. එහෙත් කුළු බඩු බොහොමයක් තවමත් වෙළෙඳාම් කෙරෙන්නේ අදාළ වර්ග හා ශ්‍රේණි කිරීම් මත ය.

ඉතා දැඩි ප්‍රමිති අවශ්‍යතා පනවා ඇත්තේ ඇමරිකානු ආහාර හා ඖෂධ පරිපාලන ආයතනය මගිනි. ඇමරිකාවට යවනු ලබන කුළු බඩු ඇමරිකානු කුළු බඩු වෙළඳ ආයතනය මගින් සකස් කර ඇති විශේෂිත ප්‍රමිතිවලට අනුකූල විය යුතු ය. එංගලන්තයට යවනු ලැබූ කුළු බඩු ද්‍රව්‍ය විශේෂයෙන් ම ඉඟුරු, කරදමුංගු, පිමෙන්ටෝ හා කළු හා සුදු ගම්මිරිස් සඳහා බ්‍රිතාන්‍ය ප්‍රමිති පිරිවිතරවලට අනුකූල විය යුතු ය. මේ අතර යුරෝපා පොදු වෙළඳ හවුලේ රටවල්මගින් සාමූහික පිරිවිතර සකස් කිරීමේ ලා දැන් සාකච්ඡා පවත්වා ගෙන යනු ලැබේ.

Unctad International Trade Forum

සඟරාවේ පළවූ ලිපියක් ඇසුරෙන් 'ගොවි ජනතාවට' සකස් කරගන්නා ලදි.